# සාමාන්‍ය සමයේ විසිදෙවන සතිය
# සෙනසුරාදා

## පළමුවන දේව ප්‍රකාශනය

ශුද්ධවූ පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**කොලොස්සි 1 : 21 – 23**

"ඔබ නිදොස් අය හැටියට උන් වහන්සේ ඉදිරියට පමුණුවා ගන්නා සේක."

පසුගිය කාලයේ දී ඔබ දෙවියන් වහන්සේගෙන් ඈත් වී සිටියා හු ය. ඔබේ නපුරු ක්‍රියා නිසා ඔබ උන් වහන්සේට සිතින් සතුරු ව සිටියහු ය. එහෙත් දැන් දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන්ගේ ජීවිතය හා මරණය කරණකොටගෙන තමන් හට ඔබ සමගි කර ගත් සේක. එසේ කළේ ඔබ ශුද්ධ, නිකැළැල්, නිදොස් අය හැටියට දැන් උන් වහන්සේ ඉදිරියට පමුණුවා ගැනීම සඳහා ය. එය ඉටු වීමට නම්, ඔබ ඇදහිල්ලේ නිරතව සිටිමින් සුබ අස්නේ බලාපොරොත්තුවෙන් පිට නොගොස්, එය පදනම් කොට ගෙන ස්ථිර ව පැවතිය යුතු ය. ඔබ ඇසූ සුබ අස්න අහසින් යට සැමදෙනට ම ප්‍රකාශ කර ඇත. පාවුලු නම් මම ඒ සුබ අස්නේ සේවකයෙක් වීමි.

දේව වචනය මෙසේ ය.

## පිලිතුරු ගීය

ගීතාවලිය **54 : 1–2, 4, 6**

පිලිතුර: අපගේ සහාය දෙවිඳාණෝ ය.

ගීය:

අහෝ දෙවිඳුනි, ඔබ නාමයේ අනුහසින් මා මුදාලුව මැනව. ඔබ බල මහිමයෙන් මා නිදහස් කළ මැනව.
දෙවිඳුනි, මාගේ යැදුමට සවන් දුන මැනව. මා පවසන වදනට ද සවන් දුන මැනව.

දෙවිඳාණෝ මාගේ සහායට වඩින සේක. සමිඳාණෝ මාගේ දිවියට රැකවරණය දෙන සේක.
තුටු පහටු සිතින් මම ඔබට පඬුරු පුදන්නෙමි. සැබැවින්ම ඔබ යහපත් බැවින් මම ඔබේ නාමය පසසන්නෙමි.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබේ දහම් මග අපට ඉගැන්නුව මැනව.
උවදුරු රහිත මගක අප ගෙන ගිය මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"මාර්ගය ද, සත්‍යය ද, ජීවනය ද මම වෙමි.
මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නේ"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 6: 1–5

"සබත් දිනයේ දී නොකටයුත්තක් ඔබ කරන්නේ මන්ද?"

එක් සබත් දිනයක ජේසුස් වහන්සේ කෙත් යායක් මැදින් ගමන් කරන විට උන්වහන්සේගේ ශ්‍රාවකයෝ කරල් කඩා අතින් පොඩිකර කෑහ. එවිට පරිසිවරුන්ගෙන් සමහරෙක් "සබත් දිනයේ දී නොකටයුත්තක් ඔබ කරන්නේ මන්දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "දාවිත් රජු තමන්ට ද සිය පිරිවරට ද බඩගිනි වූ විට කළ දේ එනම්, දෙවියන් වහන්සේගේ ගෘහයට ඇතුල්ව, පූජකයන් මිස අන් කෙනෙකුන් අනුභව නොකළ යුතු, පිදූ පූප කා සිය පිරිවරටත් දුන් පුවත ඔබ කියවා නැද්දැ"යි ඔවුන්ගෙන් ඇසූ සේක. උන්වහන්සේ තවදුරටත් කතා කරමින්, "මනුෂ්‍ය පුත්‍රයාණෝ සබත් දිනට පවා අධිපතියාණෝ ය"යි ඔවුන්ට වදාළ සේක.

සමිඳාණන් වහන්ගේ සුභාරංචිය මෙසේ ය.